# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1485 /2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023

දිනය / திகதி / Date — 29/11/2023 පැය 1645

## මාධ්‍ය නිවේදනය

### 01. මනුෂ්‍ය ඝාතනයක් - පැලියගොඩ පොලිස් වසම

2023.11.28 වන දින රාත්‍රී කාලයේදී පැලියගොඩ පොලිස් වසමේ වනවාසල පාර, තොරණ හන්දිය ප්‍රදේශයේදී තියුණු ආයුධවලින් කපාකොටා පුද්ගලයෙකු ඝාතනය කර ඇති බවට පැලියගොඩ පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 59 ක් වූ වනවාසල පාර, තොරණ හන්දිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මරණකරු වනවාසල පාර, දුම්රිය පාලම අසල සිටියදි පුද්ගලයින් දෙදෙනෙකු පැමිණ තියුණු ආයුධවලින් පහරදී පලාගොස් ඇති අතර, තුවාලකරු කොළඹ ජාතික රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත. පුද්ගලික ආරවුලක් හේතුවෙන් මෙම ඝාතනය සිදු කර ඇති බවට පොලිසිය දැනට සිදුකරන ලද විමර්ෂනයේදි අනාවරණය වේ.

පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා මෘතශරිරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇත. සිද්ධියට සම්බන්ධ සැකකරුවන් හඳුනා ගෙන ඇති අතර අත්අඩංගුවට ගැනීම සඳහා පැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. මනුෂ්‍ය ඝාතනයක් - වත්තල පොලිස් වසම

2023.11.29 වන දින උදෑසන කාලයේදී වත්තල පොලිස් වසමේ ඇල පාර, පල්ලිය වත්ත ප්‍රදේශයේ පුද්ගලයෙකු කැපුම් තුවාල සහිතව වැටී සිටින බවට වත්තල පොලිසියට ලද දුරකථන පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත. කැපුම් තුවාල සහිතව සිටි පුද්ගලයා එම ස්ථානයේදීම මියගොස් සිට ඇත.

**මරණකරු වයස අවුරුදු 68 ක් වූ වෙහෙරහේන, මාතර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු වත්තල ප්‍රදේශයේ හෝටලයක සේවය කරන පුද්ගලයකු වන අතර 2023.11.28 වන දින රාත්‍රී කාලයේ පුද්ගලයින් පිරිසක් පැමිණ තියුණු ආයුධ වලින් පහරදී මෙම ඝාතනය සිදු කර ඇති බවට පොලිසිය දැනට සිදුකල විමර්ශණයේ දී අනාවරණය වී ඇත .

මෘත දේහය මහේස්ත්‍රාත් පරීක්ෂණය සඳහා සිද්ධිය වූ ස්ථානයේ පොලිස් ආරක්ෂාව යටතේ ඇති අතර සිද්ධියට සම්බන්ධ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා වත්තල පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශණ පවත්වාගෙන යනු ලබයි .

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**